# උපදෙස්

**වැදගත් :-**
අසත්‍ය තොරතුරු සැපයීම, කුට [illegible] තැනූ හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම, දැනට ඇති ගමන් ලියවිල්ල සම්බන්ධයෙන් විස්තර හෙළිදරව් නොකිරීම හා වලංගු ගමන් ලියවිල්ලක් ළඟ තබාගෙන තවත් ගමන් ලියවිල්ලක් ලබාගැනීමට උත්සාහ කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. අසම්පූර්ණව හෝ වැරදි සහිතව සම්පූර්ණ කළ හෝ ව්‍යාජ ලේඛන සමග ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු පෞද්ගලිකව පැමිණ අයදුම්පත භාරදිය යුතුය.

## (අ) අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්.

(1) අවසන්වරට ලබාගත් ගමන් ලියවිල්ලේ (ගමන්බලපත්‍රය / හදිසි සහතිකය / හඳුනාගැනීමේ සහතිකය) අංකය මෙහි ලියන්න. මෙරටදී එය නැති වූයේ නම් පොලිසියට කරන ලද පැමිණිල්ලේ සහතික පිටපතක් හෝ විදේශයකදී නැතිවූයේ නම් මෙරටට පැමිණීම සඳහා භාවිතා කරන ලද තාවකාලික ගමන් ලියවිල්ල ඉදිරිපත් කලයුතුය. පළමුවරට අයදුම්කරන්නන්ට මෙය අදාල නොවේ.

(2) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කළ හැඳුනුම්පතේ අංකය ලියන්න. වයස අවු 16 ට වැඩි සෑම තැනැත්තෙක්ම එම හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

(3) ඔබේ වාසගම හෝ පෙළපත් නාමය ලෙස භාවිතා කරන නම එක කොටුවක එක අකුර බැගින් ලියන්න. නම් අතර එක් කොටුවක ඉඩක් හිස්ව තබන්න.

(4) අංක 03 යටතේ කොටුවල ලියූ ඔබේ වාසගම / පෙළපත් නම හැර ඔබේ සම්පූර්ණ නාමෙහි ඉතිරිය මෙම කොටුවල ලියන්න.

(5) අයදුම්කාරියක් ඇයගේ ස්වාමි පුරුෂයාගේ වාසගම පාවිච්චි කර ගමන් ලියවිල්ල ලබාගන්නේ නම් පමණක් විවාහයට පෙර නම මෙහි ලියන්න.

(6) ඔබේ ස්ථිර ලිපිනය මෙහි ලියන්න.

(7) උපන් දිනය.

(8) උප්පැන්න සහතිකයේ අංකය හා දිස්ත්‍රික්කය.

(9) උපන් ස්ථානය, උප්පැන්න සහතිකයේ දැක්වෙන පරිදි සඳහන් කරන්න.

(10) අදාළ කොටුව තුළ "√" සලකුණු කරන්න

(11) ඔබේ උස සෙන්ටිමීටර්වලින් සඳහන් කරන්න. (අඩි 1ක් සෙන්ටිමීටර් 30.4කි අඟල් 1 ක් සෙන්ටිමීටර් 2.54කි)

(12) අදාළ කොටුව තුළ "√" සලකුණු කරන්න.

(13) ඔබේ රැකියාව / වෘත්තිය / තරාතිරම හෝ තනතුර මෙහි ලියන්න. වචන අතර එක් කොටුවක ඉඩක් හිස්ව තබන්න.

(14) ආ. වි. 35 සී ආකෘති පත්‍රය එහි සඳහන් උපදෙස් පරිදි සම්පූර්ණ කොට ළමයින්ගේ වර්ණ ඡායාරූප සමග ඉදිරිපත් කරන්න.

(15) ඔබ විදේශ රටක පුරවැසිභාවය හෝ ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය හෝ ලබාගෙන ඇත්නම් අදාළ කොටුවේ "√" සලකුණු කරන්න. ශ්‍රී ලංකා ද්විත්ව පුරවැසිභාවය ලබා ඇත්නම් සහතිකය ඉදිරිපත් කරන්න.

(16) අදාළ කොටුව තුළ "√" සලකුණු කරන්න.

(17) අදාළ කොටුව තුළ "√" සලකුණු කරන්න.

(18) අදාළ කොටුව තුළ "√" සලකුණු කරන්න.

(19) ගමන් බලපත්‍ර (i) සියලුම රටවල් සඳහාද (ii) මැදපෙරදිග ඇතුළු නිශ්චිත රටවල් - ඉන්දියාව, නේපාලය, බංගලාදේශය, පකිස්ථානය, මාලදිවයින් සමූහාණ්ඩුව, ඉරානය, ඉරාකය, ලෙබනනය, සිරියාව, ජෝර්දානය, සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕමානය, කුවේටය, කටාර්, බහරේන්, සහ යේමනය යන රටවල් සඳහා ද (iii) හදිසි සහතික - ඉන්දියාව සහ නේපාලය සඳහාද (iv) හඳුනා ගැනීමේ සහතික සියලුම රටවලට හෝ නිශ්චිත රටකට වලංගු කොට නිකුත් කෙරේ. අදාළ කොටුව තුල "√" සලකුණු කරන්න.

(20) අදාළ කොටුව තුල "√" සලකුණු කරන්න. එක් දින සේවා අයදුම්පත්‍ර පෙ. ව. 9.00 සිට ප. ව. 1.00 දක්වා කොළඹ 04 ප්‍රධාන කාර්යාලයේදී පමණක් භාරගනු ලැබේ. සාමාන්‍ය සේවා අයදුම්පත්‍ර පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා ප්‍රධාන කාර්යාලයට හෝ පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හෝ භාරදිය හැකිය. විදේශ රටවල පදිංචිකරුවන් ආසන්න ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල මගින් අයදුම් කළ යුතුය.

## (ආ) ඡායාරූප

මාස 3ක් ඇතුලත ලබාගත් සෙන්ටිමීටර් 3.5 × 4.5 ප්‍රමාණයේ හොඳ තත්ත්වයේ වර්ණ ඡායාරූප 3ක්, ඉන්දෙකක් ඡායාරූප හා අත්සන් කාඩ්පතේ (ආ. වි. 35 බී) අලවා සසඳා බැලීමේ ඡායාරූපය මත අයදුම්කරු පිළිබඳව සහතිකය දෙන තැනැත්තා විසින් සහතික කර තිබිය යුතුය. තුන්වන ඡායාරූපය අයදුම්පත්‍රයේ මුල් පිටුවේ වෙන් කළ කොටුව තුළ අලවන්න.

## (ඇ) ඉදිරිපත් කළ යුතු ලේඛන

අයදුම්පත සමග පහත සඳහන් ලියවිලි ඒවායේ ඡායා පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය කටයුතු කිරීමෙන් පසු මුල් පිටපත් ආපසු ලබා දෙනු ඇත.

(i) උප්පැන්න සහතිකය (ii) පුද්ගල හැඳුනුම්පත (iii) ලියාපදිංචි කිරීමෙන් පුරවැසි භාවය ලැබුවෙක් නම් පුරවැසි සහතිකය (iv) වෙනත් රටක පුරවැසිභාවය ලබා තිබේ නම් ශ්‍රී ලංකා ද්විත්ව පුරවැසි සහතිකය (v) ස්වාමිපුරුෂයාගේ වාසගම පාවිච්චි කරන්නේ නම් විවාහ සහතිකය (vi) කලින් ලබාගත් ගමන් ලියවිල්ලක් ඇත්නම් එය සහ එහි ඡායාරූපය හා දත්ත සටහන් ඇතුලත් පිටුවල ඡායා පිටපත් (vii) වෘත්තිය/ තනතුර/තිලය සනාථ කරන ලිපිලේඛණ (viii) දරුවන්ගේ නම් ඇතුලත් කරන්නේ නම් ආ. වි. 35 සී ආකෘතියේ සඳහන් ලියවිලි (ix) අවු. 16ට අඩු දරුවන් සඳහා ගමන් බලපත් ලබා ගැනීමේ දී පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කල යුතුය. (අ) දෙමව්පියන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය (ආ) දෙමව්පියන්ගේ ගමන් බලපත්‍ර වල පිටපත් (දත්ත පිටුව සහ ළමයින් විස්තර පිටුව) (ඉ) දෙමව්පියන් ගමන් බලපත්‍ර ලබාගෙන නොමැති නම් එය තහවුරු කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශය.

## (ඈ) ගාස්තු

| | | |
|---|---|---|
| සියළුම රටවල් සඳහා | සාමාන්‍ය සේවය රු. 2500/- | එක් දින සේවය - රු. 7500 |
| මැදපෙරදිග ඇතුළු නිශ්චිත රටවල් සඳහා | සාමාන්‍ය සේවය රු. 1000/- | එක් දින සේවය - රු. 2500 |
| ඉන්දියාව සහ නේපාලය සඳහා හදිසි සහතිකය | රු. 500/- යි. | |
| සියළුම රටවල් සඳහා හඳුනා ගැනීමේ සහතිකය | රු. 2500/-යි. | |
| අයදුම්කරු අවසාන වරට ලබාගත් ගමන් ලියවිල්ල නැති වූයේ නම් රු. 10,000/-ක අතිරේක ගාස්තුවකි. (වසර 10ක් ඇතුළත) | | |

ගාස්තු සංශෝධනයන්ට යටත් වේ. **ගාස්තුව වෙනුවෙන් ලදුපතක් නිකුත් කෙරේ. පසු කලෙක විමසීම් සඳහා ලදුපත් සුරැකිව තබා ගන්න.**

